(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 46 දරන ප්‍රජා පාදක
## විශෝධන පනත

---

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී .

---

1999 දෙසැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 12. 50 යි. තැපැල් ගාස්තුව : රු. 5.25 යි.

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වැනි දින.]

එල්. ඩී.–ඕ. 28/99.

## බන්ධනාගාරගත කිරීමේ දඬුවම් නියම කිරීම වෙනුවට අධිකරණ විසින් ප්‍රජා පාදක විශෝධන ආඥා නියම කිරීම සඳහා ද, ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයකු පත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** (1) මේ පනත 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ I වන සහ III වන කොටස්, මේ පනත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනතේ II වන කොටස, *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. විවිධ අධිකරණ කොට්ඨාස හෝ අධිකරණ කලාප සම්බන්ධයෙන් වෙනස් දිනයන් නියම කරනු ලැබිය හැකි ය.

### I වන කොටස

### ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයා

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයකු පත් කිරීම ආදිය.

**2.** (1) (මෙහි මින් මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයකු නමින් හෝ ධුරයෙන් ද, ප්‍රජා පාදක විශෝධන නියෝජ්‍ය කොමසාරිස්වරයන් හා සහකාර කොමසාරිස්වරයන් යම් සංඛ්‍යාවක් ද, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් ද, පත් කරනු ලැබිය හැකි ය.

(2) සෑම ප්‍රජා පාදක විශෝධන නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ හා සහකාර කොමසාරිස්වරයකුගේ පත් කිරීමේ ලිපියෙහි, ඔහු පත් කරනු ලබන්නේ මුළු ශ්‍රී ලංකාවට ම ද, නැතහොත් එහි යම් කොටසකට ද යන වග නිශ්චිතව සඳහන් විය යුතු ය.

නියෝජ්‍ය කොමසාරිස්වරයන් හා සහකාර කොමසාරිස්වරයන්

**3**. සෑම ප්‍රජා පාදක විශෝධන නියෝජ්‍ය කොමසාරිස්වරයකු හා සෑම ප්‍රජා පාදක සහකාර කොමසාරිස්වරයකුම, කොමසාරිස්වරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, මේ පනත මගින් හෝ මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ල ම හෝ ඉන් කිසිවක් තමා පත් කරන ලද ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ හැකි ය.

කොමසාරිස් වරයාගේ කර්තව්‍යය.

**4**. කොමසාරිස්වරයාගේ කර්තව්‍යය -

(අ) මේ පනතේ කාර්ය සඳහා පිහිටුවන ලද ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන විෂයයෙහි ද, ප්‍රජා පාදක විශෝධන නියෝජ්‍ය කොමසාරිස්වරයන් හා ප්‍රජා පාදක විශෝධන සහකාර කොමසාරිස්වරයන් විෂයයෙහි ද, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධරයන් විෂයයෙහි ද පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ආ) ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මක කිරීම සඳහා උචිත මණ්ඩල සමග වැඩ කටයුතු පිළියෙල කිරීම ;

(ඇ) ප්‍රජා පාදක විශෝධන ආඥා සඳහා වරදකරුවන්ගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් අධිකරණවලට උපදෙස් දීම ;

(ඈ) ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මක කිරීම සඳහා පවත්නා පහසුකම් නිසැකව දැන ගැනීම, ඒ පහසුකම් හඳුනා ගැනීම හා ඒ පිළිබඳව අධිකරණවලට උපදෙස් දීම ;

(ඉ) අධිකරණය විසින් ඇතුළත් කිරීමට යෝජිත ප්‍රජා පාදක විශෝධන ආඥාවක් හා සම්බන්ධ කළ යුතු ඉතාම උචිත වැඩසටහන හෝ විශේෂ කොන්දේසිය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම ;

(ඊ) ප්‍රජා පාදක විශෝධන ආඥා ඇතුළත් කර ඇත්තේ යම් වරදකරුවන් සම්බන්ධයෙන් ද, ඒ වරදකරුවන් නියාමනය කිරීම, ඔවුන් ප්‍රවීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම ;

(උ) 14 වන වගන්තිය යටතේ නඩු පැවරීමේ අදහස ඇතිව, ප්‍රජා පාදක විශෝධන ආඥාවක යම් කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පිළිබඳව අධිකරණයට දැනුම් දීම ;

(ඌ) අවශ්‍ය අවස්ථාවක දී, ප්‍රජා පාදක විශෝධන ආඥාවක් වෙනස් කරන ලෙස ඉල්ලා සිටීම ;

(එ) විශෝධන මූලධර්ම, අරමුණු හා වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රජා අධ්‍යාපනය සැළසීම,

විය යුතු ය.

## II වන කොටස

## ප්‍රජා පාදක විශෝධන ආඥා

ප්‍රජා පාදක විශෝධන ආඥා.

**5**. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද -

(අ) බන්ධනාගාරගත කිරීමේ අවම දඬුවමක් නියම කිරීම අනුගම්‍ය වන යම් වරදක් ; හෝ

(ආ) වරද සඳහා නියමිත දණ්ඩනය අවුරුදු දෙකක් ඉක්මවන බන්ධනාගාරගත කිරීම් කාලයක් ඇතුළත් වන යම් වරදක්,

නොවන වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු වරදකරු කරනු ලබන අවස්ථාවක අධිකරණය විසින්, එවැනි වරදකරුවෙකු වෙත බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් හෝ අත්හිටුවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් හෝ දඩයක් නියම කිරීම වෙනුවට, එහෙත් 6,7 හා 8 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, ඒ වරදකරු සම්බන්ධයෙන් (මෙහි මින් මතු "ප්‍රජා පාදක විශෝධන ආඥාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවක් නියමිත ආකෘතියෙහි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(2) වරදකරුවකු සම්බන්ධයෙන් ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කිරීමේ දී වරදකරු විසින් සිදු කරන ලද වරදෙහි ස්වභාවය හා එහි බරපතලකම ද, ඒ වරද සිදු කිරීමෙහි ලා අදාළ වෙනත් අවස්ථානුගත කරුණු ද, වරදකරු සම්බන්ධයෙන් පූර්ව දණ්ඩන වාර්තාවක් සපයා ඇත්නම් ඒ වාර්තාව ද, එවැනි ආඥාවක් ක්‍රියාත්මක කිරීම සඳහා පවත්නා පහසුකම් ද, කෙරෙහි අධිකරණය විසින් සැළකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

පූර්ව දණ්ඩන වාර්තාව

**6**. (1) අධිකරණයක් විසින් තැනැත්තකු වරදක් සම්බන්ධයෙන් වරදකරු යැයි තීරණය කරන්නේ නම් ඒ තැනැත්තා වෙත දඬුවම් නියම කිරීමට පෙර සහ -

(අ) වරදකරු සම්බන්ධයෙන් ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කිරීම සුදුසු වන්නේ ද යන වග නිශ්චය කිරීමේ;

(ආ) ඒ ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් තිබේ ද යන වග නිශ්චය කිරීමේ ;

(ඇ) යෝජිත ආඥාව හා සම්බන්ධ කළ යුතු වඩාත් ම උචිත කොන්දේසි පිළිබඳව උපදෙස් ලබාගැනීමේ,

කාර්යය සඳහා ඒ වරදකරු සම්බන්ධයෙන් ලිඛිත වූ හෝ වාචික වූ හෝ පූර්ව දණ්ඩන වාර්තාවක් යම් නිශ්චිත දිනයක දී හෝ එදිනට පෙර හා යම් නිශ්චිත ස්ථානයක දී අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස කොමසාරිස්වරයාට නියම කළ හැකි අතර, ඒ වාර්තාව පිළියෙල කිරීමට හැකිවන පරිදි නඩු කටයුතු අඩාලව කල් තබනු ලැබිය හැකි ය.

එසේ වුව ද, අධිකරණය විසින් නඩු කටයුතු අඩාලව කල් තබනු ලබන අවස්ථාවක, දඬුවම් නියම කිරීම සඳහා වූ ස්ථානය, දිනය හා වේලාව අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණයක් විසින් වරදකරුවකුට දඬුවම් නියම කිරීම අඩාලව කල්තබනු ලබන අවස්ථාවක, අධිකරණය විසින් ඒ වරදකරු ඇප පිට මුදා හරිනු ලැබිය හැකි ය.

(3) පූර්ව දණ්ඩන වාර්තාවක් වාචිකව ඉදිරිපත් කරන ලෙස කොමසාරිස්වරයාට නියම කර ඇති අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, තම වාර්තාව විවෘත අධිකරණයේ දී ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාව අදාළ වන වරදකරුට හෝ ඔහුගේ හෝ ඇයගේ නීතිඥවරයාට ඒ වාර්තාවේ ඇතුළත් කරුණු අභියෝගයට ලක් කිරීමට හිමිකම තිබිය යුතු ය.

(4) (අ) පූර්ව දණ්ඩන වාර්තාව ලිඛිතව ඉදිරිපත් කරන ලෙස කොමසාරිස්වරයාට නියම කර ඇති අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් දඬුවම් නියම කිරීම සඳහා නියම කරන ලද දිනයට පෙර සාධාරණ කාලයක් ඇතුළත, ඔහුගේ වාර්තාවේ පිටපතක් සුදුසු යයි ඔහු විසින් සලකනු ලබන රහස්‍යභාවය සම්බන්ධයෙන් වූ යම් නියමයක් මත වාර්තාව අදාළ වන්නා වූ වරදකරු වෙත හෝ ඔහුගේ හෝ ඇයගේ නීතිඥවරයා වෙත හා නීතිපතිවරයා වෙත ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

(ආ) කොමසාරිස්වරයා විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත පූර්ව දණ්ඩන වාර්තාව සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ වරදකරු හෝ නීතිපතිවරයා විසින් හබ කරනු ලබන්නේ නම්, ඔහු හෝ ඇය විසින්, එසේ කිරීම සඳහා වූ තම අභිප්‍රාය දක්වමින් අධිකරණය වෙත මෝසමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ඇ) පූර්ව දණ්ඩන වාර්තාව අදාළ වන වරදකරුට හෝ ඔහුගේ හෝ ඇයගේ නීතිඥවරයාට හා නීතිපතිවරයාට හබ කරනු ලබන කාරණා සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවීමට හා ඒ වාර්තාවෙහි ඇතුළත් කරුණු පිළිබඳව එහි නිර්මාතෘවරයාගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දී ඇත්නම් මිස, (ආ) ඡේදය යටතේ මෝසමක් ඉදිරිපත් කරන ලද්දේ යම් පූර්ව දණ්ඩන වාර්තාවක් සම්බන්ධයෙන් ද, ඒ පූර්ව දණ්ඩන වාර්තාව, දඬුවම් නියම කිරීමේ කාර්ය සඳහා අධිකරණය විසින් සැළකිල්ලට ගනු නොලැබිය යුතු ය.

(5) අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට නියම කරන ලද පූර්ව දණ්ඩන වාර්තාවක් පිළියෙල කිරීම සඳහා කොමසාරිස්වරයා හෝ ඒ තැනැත්තා විසින් (වරදකරුට අදාළ යම් වාර්තා පරීක්ෂා කිරීම ද ඇතුළුව) අවශ්‍ය විය හැකි යම් පරීක්ෂණ හා විමර්ශන පවත්වනු ලැබිය හැකි ය.

(6) අධිකරණය විසින් දෙනු ලබන යම් විශේෂ විධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත කරන ලද නියමයක් අනුව ක්‍රියා කිරීමේ දී කොමාසාරිස්වරයා විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පූර්ව දණ්ඩන වාර්තාවක, පහත සඳහන් කරුණු ද ඇතුළුව, වරදකරුට දඬුවම්

නියම කිරීමට අදාළ වන බවට සහ ඔහු විසින් පහසුවෙන් නිසැකව දැනගත හැකි බවට කොමසාරිස්වරයාට පෙනී යන සියලු කාරණා සඳහන් විය යුතු ය : -

(අ) වරදකරුගේ වයස ;;

(ආ) (වරදකරුගෙන් යැපෙන තැනැත්තන්ගේ නම් හා වයස් ද ඇතුළුව) වරදකරුගේ සමාජයීය ඉතිහාසය හා පසුබිම ;

(ඇ) වරදකරුගේ වෛද්‍ය හා මානසික රෝග ප්‍රතිකාර පිළිබඳ ඉතිහාසය ;

(ඈ) වරදකරුගේ අධ්‍යාපන පසුබිම ;

(ඉ) වරදකරුගේ සේවා නියුක්ති ඉතිහාසය ;

(ඊ) වරදකරු, වරදකරු බවට තීරණය කරනු ලැබ ඇති හෝ ඔහුට හෝ ඇයට චෝදනා නඟා ඇති හෝ අධිචෝදනා නගා ඇති වෙනත් යම් වැරදි ;

(උ) වරදකරු කලින් නියම කර ඇති දඬුවමක් සම්බන්ධයෙන් ක්‍රියා කර ඇති ප්‍රමාණය හෝ ඔහු හෝ ඇය සම්බන්ධයෙන් දැනට බලාත්මකව පවත්නා යම් දඬුවමක් සම්බන්ධයෙන් වරදකරු විසින් ක්‍රියා කරනු ලබන ප්‍රමාණය ;

(ඌ) වරදකරුගේ ආර්ථික තත්ත්වය ;

(එ) වරදකරුගේ යම් විශේෂ අවශ්‍යතාවක් ;

(ඒ) වරදකරුගේ කලත්‍රයාගේ සේවා නියුක්ති ඉතිහාසය හා ඔහු හෝ ඇය විසින් උපයනු ලබන ආදායම ;

(ඔ) වරදකරුට ලබාදිය හැකි සහ එමගින් ඔහුට හෝ ඇයට ප්‍රතිලාභයක් සැලසෙන පාඨමාලා, වැඩ සටහන්, ප්‍රතිකාර හෝ වෙනත් සහාය ; සහ

(ඕ) ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ ඉටුකිරීම සඳහා ලබා ගත හැකි පහසුකම්.

(7) සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හබ කරනු ලැබ ඇත්තේ යම් පූර්ව දණ්ඩන වාර්තාවක ඇතුළත් කරුණු ද, ඒ පූර්ව දණ්ඩන වාර්තාව දඬුවම් නියම කිරීමේ කාර්ය සඳහා, අධිකරණය සැළකිල්ලට ගනු ලබන අවස්ථාවක, එසේ කිරීමට හේතු අධිකරණය විසින් වාර්තාගත කරනු ලැබිය යුතු ය.

ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කිරීම සඳහා වරදකරුගේ කැමැත්ත අවශ්‍ය බව.

**7**. ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කිරීම සඳහා, වරදකරු විසින්, නියමිත ආකෘතියෙහි ලිඛිතව කැමැත්ත දී ඇත්නම් මිස, ඒ වරදකරු සම්බන්ධයෙන් කිසිදු ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කරනු නොලැබිය යුතු ය.

ආඥාවේ බලපෑම වරදකරුට පැහැදිලි කළයුතු බව.

**8**. වරදකරුවකු සම්බන්ධයෙන් ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කිරීමට පෙර : -

(අ) යෝජිත ආඥාවේ කාර්ය සහ එහි බලපෑම ;

(ආ) සාධාරණ හේතුවක් නොමැතිව යෝජිත ආඥාවේ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට වරදකරු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඉන් ඇතිවන ප්‍රතිවිපාක ; සහ

(ඇ) යෝජිත ආඥාව වෙනස් කරනු ලැබිය හැකි අකාරය,

වරදකරුට පහසුවෙන් තේරුම් ගත හැකි භාෂාවෙන් අධිකරණය විසින් ඔහුට තේරුම් කර දෙනු ලැබිය යුතුය.

ප්‍රජා පාදක විශෝධන ආඥාවල කොන්දේසි.

**9**. (1) සෑම ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර, එහි පහත සඳහන් කොන්දේසි ඇතුළත් විය යුතු ය: -

(අ) වරදකරු කිරීමේ දී බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය හැකි වෙනත් වරදක් ආඥාවේ කාල සීමාව තුළ දී, වරදකරු විසින් සිදු කරනු නොලැබිය යුතු බව ;

(ආ) ආඥාවේ දින සිට පැය හැත්තෑ දෙකක් ඇතුළත වරදකරු නිශ්චිත ප්‍රජා විශෝධන මධ්‍යස්ථානයක් වෙත වාර්තා කළ යුතු බව ;

(ඇ) ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන දිනවල දී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධරයකු වෙත වරදකරු වාර්තා කළ යුතු බව සහ ඒ නිලධරයා වරදකරු බැලීමට පැමිණෙන බව ;

(ඈ) වරදකරුගේ ලිපිනයෙහි, සේවා නියුක්තියෙහි හෝ රැකියාවෙහි හෝ යම් වෙනස් වීමක්, ඒ වෙනස්වීම සිදු වීමට යටත් පිරිසෙයින් දින හතකට පෙර, වරදකරු විසින් ආඥාවේ නිශ්චිතව සඳහන් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා වෙත දැනුම් දිය යුතු බව ;

(ඉ) ආඥාවේ නිශ්චිතව සඳහන් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා විසින් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ අවස්ථාවකට අදාළව දෙනු ලබන අවසරයක් වන අවසරය ඇතිව හැර, වරදකරු නිශ්චිත ප්‍රදේශයකින් බැහැර නොයන බව ;

(ඊ) 2 වන වගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන් විසින් නිකුත් කරනු ලබන සියලු නීත්‍යානුකූල රීතිවලට, උපදෙස්වලට හා විධානවලට වරදකරු අවනත වන බව.

(2)(අ) වරදකරුගේ සාපරාධී හැසිරීම කෙරෙහි දායක වූ පෞද්ගලික සාධක කිසිවක් තක්සේරු කිරීම හැකි කිරීමේ ;

(ආ) ඒ සාධක හඳුනා ගැනීමට, ඒවා පාලනය කිරීමෙහි ලා පියවර ගැනීමට සහ අවශ්‍ය වන්නේ නම් ඒවා සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට වරදකරුට අවස්ථාවක් ලබා දීමේ ; සහ

(ඇ) ස්වකීය සාපරාධී හැසිරීම කෙරෙහි කෙළින්ම අදාළ ක්ෂේත්‍රයන්හි අඩුලුහුඩුකම් ඇති වරදකරුවකුට. ඒ අඩුලුහුඩුකම්වලට පිළියම් යෙදීම සඳහා සැළසුම් කර ඇති වැඩසටහන්වලට සහභාගී වීමේ,

කාර්ය සඳහා අධිකරණය විසින්, ප්‍රජා පාදක විශෝධන ආඥාවකට පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් ඇතුළත් කරනු ලැබිය හැකි යː -

(i) ආඥාවෙහි නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන භාර නිලධරයා විසින් විධාන කරනු ලබන පරිදි වූ ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ, අධිකරණය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා වරදකරු විසින් ඉටු කරනු ලබන බව ;

(ii) වරදකරු, කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධරයකුගේ අධීක්ෂණය යටතේ සිටිය යුතු බව ;

(iii) අධිකරණය විසින් නිශ්චය කරනු ලබන හා කොමසාරිස්වරයා විසින් විධාන කරනු ලබන අධ්‍යාපනික, වෘත්තීමය හා පෞද්ගලික පුහුණුවීම් හා සංවර්ධන වැඩසහටන්වලට වරදකරු සහභාගි වන බව ; ස්වකීය සාපරාධී හැසිරීම කෙරෙහි කෙළින් ම අදාළ ක්ෂේත්‍රයන්හි දැඩි අඩුලුහුඩුකම් ඇති වරදකරුවකුට, ඒ අඩුලුහුඩුකම්වලට පිළියම් ලබාදෙන වැඩසටහන්වලට සහභාගි වන ලෙස නියම කරනු ලැබිය හැකි බව ;

(iv) අධිකරණය විසින් විධාන කරනු ලබන පරිදි, වරදකරු මද්‍යසාර හෝ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම පිළිබඳව තක්සේරුවකට භාජනය විය යුතු බව හා ඒ සඳහා ප්‍රතිකාර ලබා ගත යුතු බව හෝ ඔහු වෛද්‍ය, මානසික හෝ මනෝ චිකිත්සක තක්සේරුවකට හා ප්‍රතිකාර ලබා ගැනීමකට භාජනය විය යුතු බව ;

(v) ආඥාවෙහි නිශ්චිතව සඳහන් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා විසින් විධාන කරනු ලබන පරදි, මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය භාවිතය පරීක්ෂා කිරීම සඳහා වරදකරු ඉදිරිපත් වන බව ;

(vi) ආඥාව ඇතුළත් කරනු ලබන්නේ යම් කාර්ය සඳහා ද ඒ කාර්ය සැලකිල්ලට ගෙන, අධිකරණය විසින් අවශ්‍ය හෝ යෝග්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කොන්දේසියක් ;

(3) ප්‍රජා පාදක විශෝධන ආඥාවක කාර්ය සඳහා, ආඥාව ඇතුළත් කරනු ලැබ ඇත්තේ යම් වරදකරුවකු සම්බන්ධයෙන් ද ඒ වරදකරු විසින්, ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ ඉටු කළ යුතු කාලය නිශ්චය කිරීමේ දී, අධිකරණය විසින්, මේ පනතේ උපලේඛනයේ විධිවිධාන කෙරෙහි සැළකිල්ල දැක්විය

යුතු ය. එසේ වුවද, ආඥාව ඇතුළත් කරනු ලැබ ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන් ද, ඒ වරද සඳහා වරදකරු යටත්වන බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය, ඒ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව සඳහන් කාලය හෝ මුදල් ප්‍රමාණය නොඉක්මවන අවස්ථාවක, ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ කිරීමේ කාලය, ක්‍රියාත්මක කළ හැකිතාක් දුරට, උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන අනුරූප සටහනේ නිශ්චිතව දැක්වෙන කාල සීමාවට සමාන විය යුතු ය.

(4) ප්‍රජා පාදක විශෝධන ආඥාවක් යටතේ ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ ඉටු කිරීමට නියම කරනු ලැබ ඇති වරදකරුවකු විසින්, දින හතක යම් කාලයක් තුළ පැය දහයකට නොඅඩු සහ පැය විසිහතරකට නොවැඩි කාලයක් සඳහා ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ ඉටු කරනු ලැබිය යුතු ය.

එසේ වුවද, වරදකරුවකු විසින් කොමසාරිස්වරයා වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත, දින හතක යම් කාලයක් තුළ දී පැය හතලිහක් දක්වා වැඩ කිරීමට, කොමසාරිස්වරයා විසින් ඒ වරදකරුට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(5) වරදකරුවකු අසනීප වී ඇති බවට හෝ වෙනත් විශේෂ අවස්ථානුගත කරුණු ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, (4) වන උපවගන්තියේ කුමක් සඳහන් ව ඇත ද, කොමසාරිස්වරයා විසින්, දින හතක කාලයක් තුළ පැය දහයකට අඩු කාලයක් ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ ඉටු කිරීමට වරදකරුවකුට අවසර දෙනු ලැබිය හැකි ය:

එසේ වුවද, වරදකරු සම්බන්ධයෙන් කරන ලද ප්‍රජා පාදක විශෝධන ආඥාවේ නිශ්චිතව සඳහන් පැය ගණන සඳහා ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ ඉටු කිරීමට වරදකරුවකුට ඇති යුතුකම කෙරෙහි, මේ උපවගන්තිය යටතේ දෙන ලද අවසරය බලනොපාන්නේ යයි සළකනු ලැබිය යුතු ය.

(6) වරදකරුවකු විසින් සිදු කරනු ලැබූ වැරදි දෙකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන්, අධිකරණයක් විසින් වෙන් වෙන් වශයෙන් වූ ප්‍රජා පාදක විශෝධන ආඥා කරනු ලබන්නේ නම්, අධිකරණය විසින් අන්‍යාකාරයෙන් විධාන කරනු ලබන්නේ නම් මිස, ඒ ආඥාවල කොන්දේසි සමගාමී විය යුතු ය.

(7) අධිකරණය විසින් අන්‍යාකාරයකින් විධාන කරනු ලබන්නේ නම් මිස, වරදකරුවකු සම්බන්ධයෙන් කරන ලද ප්‍රජා පාදක විශෝධන ආඥාවක කොන්දේසි, ඒ වරදකරු සම්බන්ධයෙන් බලාත්මකව පවත්නා වෙනත් යම් ප්‍රජා පාදක විශෝධන ආඥාවක කොන්දේසි හා සමගාමී විය යුතු ය.

(8) ප්‍රජා පාදක විශෝධන ආඥාවක් යටතේ වරදකරුවකු විසින් ඉටු කිරීමට ඉතිරිව ඇති ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩවල සම්පූර්ණ පැය ගණන පැය පන්සියයක් ඉක්මවන ප්‍රතිඵලයක් ඇති කරන විධානයක් අධිකරණයක් විසින් කරනු නොලැබිය යුතු ය.

ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ පැවරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු.

**10**. ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කරනු ලැබ ඇත්තේ යම් වරදකරුවකු සම්බන්ධයෙන් ද ඒ වරදකරු විසින් ඉටු කළ යුතු ගෙවීමක් කරනු නොලබන ප්‍රජා වැඩ පැවරීමේ දී, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා විසින් වරදකරුගේ වයස, සෞඛ්‍ය තත්ත්වය, අධ්‍යාපනය සහ ආගමික හා සංස්කෘතික විශ්වාස ද වදරකරුගේ නිවසේ හෝ ඔහු සේවයේ නියුක්ත ස්ථානයේ සිට යෝජිත වැඩ පොලට ඇති දුර ද, වදරකරුගේ අධ්‍යාපනයට හෝ සේවා නියුක්තියට සිදුවිය හැකි බාධා ද සැළකිල්ලට ගනු ලැබිය යුතු ය.

ප්‍රජා පාදක විශෝධන ආඥා වෙනස් කිරීම.

**11**. (1) ප්‍රජා පාදක විශෝධන ආඥාවක් බලාත්මකව පවතින කාලය තුළ දී, ඒ ආඥාව ඇතුළත් කරන අධිකරණය විසින් : -

(අ) ආඥාව ඇතුළත් කරනු ලැබුවේ යම් වරදකරුවකු සම්බන්ධයෙන් ද, ඒ වරදකරු හෝ කොමසාරිස්වරයා හෝ විසින් කරනු ලබන ඉල්ලීමක් මත : සහ

(ආ) (i) ආඥාව ඇතුළත් කිරීමෙන් පසු වරදකරුගේ අවස්ථානුගත කරුණු වැදගත් ලෙස වෙනස් වී ඇති බවට සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ආඥාවේ කවර හෝ කොන්දේසියක් අනුව ක්‍රියා කිරීමට වරදකරුට නොහැකි බවට සෑහීමට පත්වීමේ දී ;

(ii) ආඥාව කරනු ලැබීමට පෙර, අධිකරණයට හෝ පූර්ව දණ්ඩන වාර්තාව කළ නිර්මාතෘවරයා වෙත වරදකරුගේ අවස්ථානුගත කරුණු වැරදි ලෙස ඉදිරිපත් කර ඇති බවට හෝ නිවැරදිව ඉදිරිපත් කර නොමැති බවට සෑහීමට පත් වීමේ දී ;

(iii) වරදකරු තවදුරටත් ආඥාවට අනුව ක්‍රියා කිරීමට කැමැත්තක් නොදක්වන බවට සෑහීමට පත් වීමේ දී,

ඒ ආඥාව වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ කළ හැකි ය. තව ද, (2) වන උපවගන්තියට යටත්ව, වරදකරු ඒ වරද හෝ ඒ වැරදි සම්බන්ධයෙන් අධිකරණය විසින් වරදකරු බවට එවේලෙහි තීරණය කරනු ලැබී නම්, ඔහු හෝ ඇය සම්බන්ධයෙන් අධිකරණය කටයුතු කළ හැකි යම් ආකාරයකින්, ඒ ආඥාව ඇතුළත් කරන ලද්දේ යම් වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් ද, ඒ වරද හෝ වැරදි සඳහා අධිකරණය විසින් ඒ වරදකරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

(2) ප්‍රජා පාදක විශෝධන ආඥාවක් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක් පිළිබඳ දැන්වීමක්, ආඥාව අදාළවන වරදකරුට ද, කොමසාරිස්වරයාට ද, නීතිපතිවරයාට ද දෙනු ලැබිය යුතු ය.

(3) වරදකරුවකු සම්බන්ධයෙන් ඇතුළත් කරන ලද ප්‍රජා පාදක විශෝධන ආඥාවක් අවලංගු කිරීමෙන් පසුව ඒ වරදකරුවකු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, ආඥාව අවලංගු කිරීමට පෙර, වරදකරු ආඥාවේ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කර ඇති ප්‍රමාණය අධිකරණය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

වෙනත් තැනැත්තකු වෙත හෝ වෙනත් ස්ථානයකට වාර්තා කරන ලෙස කොමසාරිස්වරයා විසින් විධාන කළ හැකි බව.

**12.** (1) ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කරනු ලැබ ඇත්තේ යම් වරදකරුවකු සම්බන්ධයෙන් ද ඒ වරදකරුට. ස්වකීය නිවාසස්ථානය හෝ සේවා ස්ථානය වෙනස් වීම හේතු කොට ගෙන නැතහොත් වෙනත් හේතුවක් නිසා ඒ ප්‍රජා පාදක විශෝධන ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රජා විශෝධන මධ්‍යස්ථානයට වාර්තා කිරීම අපහසු වන අවස්ථාවක, ඔහු හෝ ඇය විසින් ඒ පිළිබඳව කොමසාරිස්වරයා වෙත වහාම දැනුම් දිය යුතු අතර, වෙනත් ප්‍රජා විශෝධන මධ්‍යස්ථානයක් වෙත වාර්තා කරන ලෙස කොමසාරිස්වරයා විසින් වරදකරුට විධාන කළ හැකි ය.

(2) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ වරදකරුට පැමිණ සිටින ලෙසට විධාන කරන ලද ස්ථානය හෝ ඉදිරිපිට පෙනී සිටීමට විධාන කරන ලද තැනැත්තා, ඒ වරදකරු සම්බන්ධයෙන් ඇතුළත් කරන ලද ප්‍රජා පාදක විශෝධන ආඥාවේ නිශ්චිතව සඳහන් ස්ථානය හෝ තැනැත්තා වූවාක් මෙන් ඒ වරදකරු ඒ ස්ථානයට පැමිණීම හෝ ඒ තැනැත්තා ඉදිරියේ පෙනී සිටීම හෝ කළ යුතු ය.

ප්‍රජා පාදක විශෝධන ආඥාව අත්හිටුවීම.

**13**. ප්‍රජා පාදක විශෝධන ආඥාවක් ඇතුළත් කරනු ලැබුවේ යම් වරදකරුවකු සම්බන්ධයෙන් ද ඒ වරදකරුට රෝගී බව නිසා හෝ වෙනත් අතිවිශේෂ හේතුවක් නිසා ඒ ආඥාව අනුව ක්‍රියා කිරීමට නොහැකි බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, නිශ්චිත කාලයක් සඳහා ආඥාව හෝ එහි යම් කොන්දේසියක් හෝ ක්‍රියාත්මක කිරීම අත්හිටුවනු ලැබිය හැකි අතර, එසේ නිශ්චිත කරනු ලැබූ කාලය ප්‍රජා පාදක විශෝධන ආඥාව බලාත්මකව පැවතිය යුතු කාලය ගණන් ගැනීමේ දී නොසළකා හරිනු ලැබිය යුතු ය.

ප්‍රජා පාදක විශෝධන ආඥාව අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම වරදක් බව.

**14**. (1) සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රජා පාදක විශෝධන ආඥාවක යම් කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් වරදකරුවකු මේ පනත යටතේ වරදකට වරදකරුවකු වන අතර, ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ වරදක් කරනු ලබන අවස්ථාවක පැහැර හැරීම කරනු ලැබ ඇත්තේ යයි කියනු ලබන්නේ යම් ප්‍රජා පාදක විශෝධන ආඥාවකට අදාළව ද, ඒ ප්‍රජා පාදක විශෝධන ආඥාව ඇතුළත් කළ අධිකරණය වෙත කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් වූ වාර්තාවක් කිරීමෙන්, ඒ වාර්තාවේ නිශ්චිතව සඳහන් තැනැත්තා විසින් වාර්තාවේ නිශ්චිතව සඳහන් ආඥාවේ කොන්දේසි අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවට ඒ වරද සම්බන්ධයෙන් නඩු කටයුතු පවරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ ලියවිල්ලකින් වූ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේ දී, අධිකරණය විසින් වරදකරු වෙත සිතාසි හෝ සිරභාරයට ගැනීමේ වරෙන්තුවක් හෝ නිකුත් කරනු

ලැබිය හැකි අතර, වැරදි ලසු ආකාරයෙන් විභාග කිරීම සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ වරද විභාග කිරීම කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී ඒ ආඥාව තත්කාලයේ බලාත්මකව පවත්නේ නම් අධිකරණය විසින් -

(අ) පැහැර හැරීම කරනු ලැබුවේ යම් ප්‍රජා පාදක විශෝධන ආඥාවක් සම්බන්ධයෙන් ද ඒ ප්‍රජා පාදක විශෝධන ආඥාව වෙනස් කිරීම ;

(ආ) ඒ ආඥාව අවලංගු කිරීම,

කරනු ලැබිය හැකි ය.

(5) ප්‍රජා පාදක විශෝධන ආඥාවක් අවලංගු කිරීමේ දී වරදකරු ඒ වරද සඳහා එවේලෙහි වරදකරු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ නම්, ඔහු හෝ ඇය සම්බන්ධයෙන් අධිරණය විසින් ක්‍රියා කරනු ලැබිය හැකිව තිබුණු යම් ආකාරයකින්, ආඥාව ඇතුළත් කරන ලද්දේ යම් වරදක් හෝ වැරදි සම්බන්ධයෙන් ද ඒ වරද හෝ වැරදි සඳහා අධිකරණය විසින් (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව කටයුතු කරනු ලැබිය හැකි ය.

(6) ප්‍රජා පාදක විශෝධන ආඥාවක් අවලංගු කිරීමෙන් පසු වරදකරුවකු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී එය අවලංගු කිරීමට පෙර වරදකරු විසින් ඒ ආඥාවේ කොන්දේසිවලට අනුව ක්‍රියා කර ඇති ප්‍රමාණය අධිකරණය සැළකිල්ලට ගනු ලැබිය යුතු ය.

දඩ මුදලේ කොටසක් ගෙවීමේ හෝ ආඥාවේ සඳහන් වැඩ සටහන් කොන්දේසිය සපුරාලීමේ ප්‍රතිඵලය.

**15**. (1) දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ප්‍රජා පාදක විශෝධන ආඥාවක් කරනු ලැබුවේ යම් වරදකරුවකු සම්බන්ධයෙන් ද, ඒ වරදකරු විසින් ආඥාව බලාත්මකව පවත්නා යම් කාලයක් තුළ ඒ දඩයේ කොටසක් අධිකරණය වෙත ගෙවනු ලැබූ අවස්ථාවක ගෙවීම පිළිබඳ සාක්ෂි ලැබීමෙන් පසු, කොමසාරිස්වරයා විසින්, ගෙවා ඇති මුදල දඩ මුදලට දරන්නා වූ අනුපාතයට සමාන අනුපාතයකින් ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කාල සීමාවෙන් යම් කාල සීමාවක් අඩු කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, ආඥාවේ අනිකුත් කොන්දේසි තවදුරටත් බලාත්මක විය යුතු ය.

(2) ප්‍රජා පාදක විශෝධන ආඥාවකට ඇතුළත් ලැබූ එකම කොන්දේසිය ආඥාව අදාළ වන වරදකරු විසින් ගෙවීමක් නොලබන ප්‍රජා වැඩ ඉටු කිරීම පමණක් වන අවස්ථාවක සහ ඒ වරදකරු විසින් ආඥාවේ නිශ්චිතව සඳහන් කාල සීමාව තුළ, ඔහුට හෝ ඇයට පවරන ලද ප්‍රජා වැඩ සෑහීමකට පත්විය හැකි ආකාරයට ඉටු කර ඇති බවට කොමසාරිස්වරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක වරදකරු විසින් ඒ ආඥාවේ කොන්දේසි අනුව ක්‍රියා කර ඇති ලෙස සළකනු ලැබිය යුතු ය.

III වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

**16**. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන එලගැන්වීමේ කාර්යය සඳහා සහ නියමිත යයි මේ පනතින් නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, එහි අනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය. නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සළකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**17**. (1) මේ පනතේ කාර්ය සඳහා පිහිටුවන ලද ප්‍රජා විශෝධන මධ්‍යස්ථානවල හෝ යම් විශේෂ ප්‍රජා විශෝධන මධ්‍යස්ථානයක පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද කිසිදු රීතියක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමත කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

1979 අංක 15 දරන පනතේ 18 වන වගන්තිය අදාළ කිරීම.

**18**. (1) වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් යම් අධිකරණ කොට්ඨාසයක් තුළ හෝ අධිකරණ කලාපයක් තුළ මේ පනතේ II වන කොටස ක්‍රියාත්මක කරන ලද අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ අධිකරණ කොට්ඨාසය හෝ අධිකරණ කලාපය තුළ අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණ විසින්. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 18 වන වගන්තිය මගින් ඒ අධිකරණ වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම නතර විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**19**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපනය.

**20**. මේ පනතේ "අධිකරණ කොට්ඨාසය" සහ "අධිකරණ කලාපය" යන්නෙන්, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් නිශ්චය කරන ලද, පිළිවෙලින් අධිකරණ කොට්ඨාසයක් සහ අධිකරණ කලාපයක් අදහස් වේ.

**උපලේඛනය** [ 9 (3) වන වගන්තිය]

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩ මුදලේ ප්‍රමාණය | ගෙවීමක් නොලබන ප්‍රජා වැඩ කාල සීමාව |
| අවුරුදු 1 ක් හෝ ඊට වැඩි කාලයක් | අවුරුදු 1 ක කාල සීමාවක් තුළ පැය 200 සිට 300 දක්වා |
| මාස 6 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 1 කට වඩා අඩු කාලයක් | මාස 6 ක කාල සීමාවක් තුළ පැය 100 සිට 200 දක්වා |
| මාස 6කට අඩු කාලයක් | මාස 3ක කාල සීමාවක් තුළ පැය 50 සිට 100 දක්වා |
| රුපියල් පන්දහසක් හෝ ඊට වැඩි මුදලක් | අවුරුදු දෙකක කාල සීමාවක් තුළ පැය 200 සිට 300 දක්වා |

| *I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| **බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩ මුදලේ ප්‍රමාණය** | **ගෙවීමක් නොලබන ප්‍රජා වැඩ කාල සීමාව** |
| රුපියල් හාර දහසක් හෝ ඊට වැඩි එහෙත් රුපියල් පන් දහසකට අඩු මුදලක් | අවුරුදු එකහමාරක කාල සීමාවක් තුළ පැය 150 සිට 200 දක්වා |
| රුපියල් තුන් දහස් පන්සියයක් හෝ ඊට වැඩි එහෙත් රුපියල් හාර දහසට අඩු මුදලක් | අවුරුදු එකක කාල සීමාවක් තුළ පැය 75 සිට 150 දක්වා |
| රුපියල් තුන් දහසක් හෝ ඊට වැඩි එහෙත් රුපියල් තුන් දහස් පන්සියයට අඩු මුදලක් | මාස හයක කාල සීමාවක් තුළ පැය 50 සිට 75 දක්වා |
| රුපියල් තුන් දහසකට අඩු මුදලක් | මාස තුනක කාල සීමාවක් තුළ පැය 50 සිට 75 දක්වා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.